**කරන්දෙණිය ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 13 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බැලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂයට අදාළව අය කළ රු.212,912 ක් වූ වැටුප් රහිත නිවාඩු සමාලෝචිත වර්ෂයේ වැටුප් හා වේතන ගිණුම්වලට එකතු කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු එක්වන් මුදල් රු.250,000 ක් වර්ෂය තුළ නිදහස් කිරීමේ දී, එක්වන් මුදල් ගිණුමට ගිණුම්ගත කිරීම වෙනුවට හිඟහිටි එක්වන් මුදල් ගිණුමට ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.12,351,877 ක දායක මුදල් ගිණුම් ගතකර නොතිබුණි. | ගෙවිය යුතු මුදල් ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ ආයුර්වේද සංස්ථාවෙන් පරිත්‍යාග ලෙස ලද එකතුව රු.157,572 ක් වටිනා | පරිත්‍යාග ගිණුම්ගත | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී |

| | | |
|---|---|---|
| ඖෂධ තොගය ගිණුම්ගත කර නොතිබුණි. | කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.290,254 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | කාලයක සිට පවතින අසමාන - තාවයන් බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.228,909,037 ක් වූ ගිණුම් විෂයයන් 08 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඈ) අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා තීරණයක් මත 2015 වර්ෂයේ සිට කඩ බදු සංශෝධනය කර සමාලෝචිත වර්ෂයේ රු.790,000 ක් ලේඛනවලින් කපාහැර තිබුණි. | සංශෝධන සඳහා අධිකාරී බලය ලබාගත යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කර ගනිමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| **(අ)** | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) වගන්ති | - | බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ නව වරිපනම් කළාප ලෙස හඳුනාගෙන නොතිබුණි. | වරිපනම් කලාප ප්‍රකාශ කර, බදු අයකර සභා අරමුදල ශක්තිමත් කරගත යුතු වේ. | ඉදිරියේ දී වරිපනම් බදු අය කරමි. |
| **(ඇ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 14,668,437 | වසර 02 ක කාලය ඉක්ම වූ තැන්පතු ශේෂය සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.17,479,978 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.20,201,662 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,424,801 | 1,814,748 | 1,718,542 | 4,486,259 | 2,778,641 | 1,847,690 | 1,597,267 | 4,424,801 |
| කුලී | 7,608,495 | 5,809,826 | 4,639,494 | 8,774,252 | 8,145,400 | 7,378,600 | 6,447,742 | 7,608,495 |
| බලපත්‍ර ගාස්තු | 123,350 | 154,250 | 154,250 | 123,350 | 300,000 | 235,986 | 235,986 | 123,350 |
| වෙනත් ආදායම් | 47,187,762 | 20,222,433 | 8,153,500 | 60,526,102 | 6,414,000 | 20,888,419 | 5,607,500 | 47,187,762 |
| | 59,344,408 | 28,001,257 | 14,665,786 | 73,909,963 | 17,638,041 | 30,350,695== | 13,888,495 | 59,344,408 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අයවිය යුතු මුළු ආදායම රු.87,345,666 ක් වුවද, වර්ෂයේ අයවීම් රු.14,665,786 ක් හෙවත් සියයට 17 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) වරිපනම්**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය වූ රු.3,312,495 තුළ උප කාර්යාලයේ පමණක් රු.10,000 ට වැඩි හිඟ වරිපනම් ශේෂ පවතින බදුකරුවන් 34 දෙනෙකු විය. හිඟ වරිපනම් අය කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) (අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

(ආ) **ජල බදු**

---------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උඃරගස්මන්හන්දිය ජල ව්‍යාපෘතියෙන් රු.706,125 ක හිඟ බදු පැවතුණි. | හිඟ බදු අයකර ගත යුතු වේ. | ඉදිරියේදී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.4 කුලී ආදායම**

---------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.8,774,252 ක හිඟ ශේෂයක් වූ අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(ආ) වගන්තිය ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.5 බලපත්‍ර ගාස්තු**

----------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| වසර 03 කට වඩා පැරණි රු.123,350 ක් වූ හිඟ බලපත්‍ර ගාස්තු ශේෂයක් සම්බන්ධයෙන් තොරතුරු සොයා හිඟ මුදල් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | බලපත්‍ර ගාස්තු නොගෙවන ව්‍යාපාර සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගතයුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.6 වෙනත් ආදායම්**

--------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ඉකුත් වර්ෂය අවසානයට රු.47,187,762 ක් වූ වෙනත් ආදායම් හිඟ ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයට රු.60,526,102 ක් දක්වා වර්ධනය වී තිබූ අතර, එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 28 ක වර්ධනයක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) ක්‍රියාකාරී සැලැස්ම

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබුණ අතුරු ව්‍යවස්ථාව අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | ඉදිරියේ දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

#### (ආ) අත්හැර දැමූ කර්තව්‍යයන්

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2006 වර්ෂයේ දී දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් විශාල වටිනාකමකින් යුත් කාය වර්ධන ක්‍රීඩා භාණ්ඩ තොගයක් සභාවට ලබා දී තිබූ අතර, 2011 වර්ෂයේ දී එම අමාත්‍යාංශයේම ප්‍රතිපාදන මඟින් රු.1,470,000 ක් වැයකර සභාව සතු ඉඩමක ශාරීරික සුවතා, කාය වර්ධන මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණි. භෞතික විගණන පරීක්ෂාවේ දී හා සභාවෙන් ලද තොරතුරු අනුව 2011 වර්ෂයෙන් පසු මෙම උපකරණ ප්‍රයෝජනයට ගෙන නොතිබූ අතර, මේ සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් සභාව සතුව නොතිබුණි. | උපකරණ ලේඛනගත කළයුතු අතර, ව්‍යාපෘතියෙන් ප්‍රදේශයේ ජනතාවට සේවයක් ලබා දිය යුතු වේ. | ඉදිරියේ දී උපකරණ ලේඛනගත කර ජනතාවට සේවයක් ලබා දීමට කටයුතු කරමි. |

**(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශයේ තෝරාගත් ප්‍රදේශ වල වෙන්කිරීමකින් තොරව දිනපතා එකතු කරනු ලබන කසළ ටොන් 25 ක් පමණ පුංචි බොරකන්ද පෞද්ගලික ඉඩමකට දමා පස් දැමීම සිදු කරනු ලබන බව දක්වා තිබුන ද, භෞතික විගණන පරීක්ෂාවේ දී එසේ පස් නොදැමීම නිසා ඉඩමෙහි කසළ විසිරී තිබුණි. | කසළ බැහැර කිරීම සඳහා විධිමත් හා දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සකස් කළ යුතු වේ. | ඉඩමක් ලබාගෙන කසළ බැහැර කරලීම සඳහා ඉදිරියේ දී විධිමත් වැඩපිලිවෙලක් ක්‍රියාත්මක කරමි. |

**(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතු වේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාවට අයත් ප්‍රධානම පෙර පාසල වූ මහජ්දණ්ඩ පෙර පාසල 2015 වර්ෂයේ සිටම වසා දමා තිබුණි. | පෙර පාසල සක්‍රීයව පවත්වා ගතයුතු වේ. | ඉදිරියේ දී පෙර පාසල සක්‍රීය කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2013 ඔක්තෝබර් සිට අයකර තිබූ එකතු කළ අගය මත බදු රු.11,423,377 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. | අදාළ බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු වේ. | දැනට ගෙවීමට කටයුතු කරගෙන යමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු එක්වන් මුදල් රු.250,000 ක් වර්ෂය තුළ ආදායමට ගෙන තිබූ අතර, එය නිදහස් කිරීමේ දී 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයට පටහැනිව නැවත ටෙන්ඩර් කිරීමකින් තොරව සභා අරමුදලින් ගෙවා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේ දී නැවත ටෙන්ඩර් කිරීමට කටයුතු කරමි. |

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | ------------------------ | ------------ | ------------------- |
| (අ) | සේවක පුරප්පාඩු හා අතිරික්ත<br>---------------------------------- | | |
| | (i) අතිරික්තව පැවති තනතුර විධිමත් කර ගැනීමටත් ප්‍රාථමික අංශයේ තනතුරු 10 ක පුරප්පාඩු විධිමත්ව බඳවා ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු විධිමත්ව බඳවා ගැනීමටත්, අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු බඳවා ගැනීමටත් අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කරමි. |
| | (ii) සභාවේ අනියම් හා ආදේශක පදනමින් බඳවා ගත් සේවකයින් 09 දෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළ වැටුප් හා දීමනා සඳහා රු.1,508,581 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | අනියම් හා ආදේශක තනතුරු විධිමත්ව බඳවා ගත යුතු වේ. | ඉදිරියේ දී විධිමත්ව බඳවා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | **සේවක ණය**<br>--------------- | | |
| | සේවකයින් 48 දෙනෙකු විසින් ලබාගත් අය නොවී පවතින රු.687,410 ක ණය ශේෂ අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | හිඟ සේවක ණය අයකර ගතයුතු වේ. | තොරතුරු සොයාගෙන සේවක ණය අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

---------------------------

**ඌන උපයෝජිත වත්කම්**

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් පෙර පාසල් ළමා උද්‍යානය සඳහා 2016 වර්ෂයේ ර.315,500 ක් වැයකර සෙල්ලම් උපකරණ කට්ටල 05 ක් සවිකර තිබූ අතර, මෙම පෙර පාසල වසාදැමීම නිසා පෙර පාසල් ගොඩනැගිල්ල ඇතුළුව මේස සහ පුටු, සෙල්ලම් උපකරණ නිෂ්කාර්යව පැවතුණි. | ප්‍රදේශයේ ජනතාවට සේවයක් ලබා දියයුතු වේ. | පෙර පාසල ආරම්භ කර, ප්‍රදේශයේ ජනතාවට සේවයක් ලබා දීමට කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

---------------------------------------

**4.1 අයවැය පාලනය**

------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වියදම් විෂයයන් 07 ක රු.30,660,733 ක ඉතිරිවීම් වූ අතර, එම වටිනාකම් සියයට 21 සිට සියයට 47 ක් දක්වා පරාසයක විය. | තාත්ත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් කටයුතු කරමි. |
| (ආ) | ආදායම් විෂයයන් 04 ක ළඟාකර නොගත් ඉලක්කයන්ගේ එකතුව රු.22,025,929 ක් වූ අතර, එම වටිනාකම සියයට 21 ත් සියයට 61 ත් අතර පරාසයක විය. | තාත්ත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් කටයුතු කරමි. |

**4.2** **අභ්‍යන්තර විගණනය**

-----------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබූ අතර, අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කිරීමේ දී විගණකාධිපතිගෙන් විමසීම් කර නොතිබුණි. එසේම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා එවීමට කටයුතු කරමි. |